# මහායාන බෝධිසත්ත්ව භූමි සංකල්ප පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

බුත්තල කෝවිද හිමි[1]

## හැඳින්වීම

මහායාන බෞද්ධ දර්ශනයට අනුව සාමාන්‍ය පුද්ගලයකු සම්බුද්ධත්වය කරා ගමන් කිරීමේ දී පසු කරනු ලබන ප්‍රධාන ආධ්‍යාත්මික සංවර්ධන මට්ටම් බෝධිසත්ව භූමි ලෙස හඳුන්වනු ලබයි. ප්‍රධාන මහායාන සූත්‍රයක් වන දස භූමික සූත්‍රයට අනුව මහා භූමි දහයක් පවතී. බෝධිසත්වවරයෙකු මහා කරුණාව හා ප්‍රඥාව පෙරදැරි කරගෙන පාරමිතා පුරමින් මෙම භූමි එකිනෙක පසු කර අවසානයේ දී බුද්ධත්වයට පත් වේ. මෙහි දී මෙම බෝධිසත්ව සංකල්පය හා දශ භූමි පිළිබඳ කරුණු අවධාරණය කරනු ලැබේ.

## පර්යේෂණ අරමුණ

මහායාන ඉගැන්වීම්හි ප්‍රකට බුද්ධත්වය පිණිස හේතු වන බෝධිසත්ව දශ භූමි සංකල්ප පුද්ගල විමුක්ති සාධනයට කෙතෙක් දුරට හේතු වන්නේ ද යන්න විමර්ශනය කිරීම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ යි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය විධිමත් කර ගැනීම සඳහා ගුණාත්මක පර්යේෂණ විධික්‍රමවේදය භාවිත වන පර්යේෂණයක් වශයෙන් මෙහි අවස්ථානුකූලව තාර්කික විශ්ලේෂණ පර්යේෂණ විධික්‍රමවේද ලෙස භාවිත කෙරේ.

## ප්‍රතිඵලය හා සාකච්ඡාව

බෝධිසත්ව සංකල්පයට හා බෝධි චිත්තයට මහායාන බෞද්ධ චින්තනය සුවිශේෂී තැනක් හිමි වේ. පෙළ දහමේ මෙන් ම සංස්කෘත සාහිත්‍යය ද බෝධි සත්වයන්ට අර්ථ සපයා ඇත. බෝධි යනු, අවබෝධය යි. නිවන අවබෝධ කිරීම බෝධිය නම් වේ. පාලි අට්ඨකථාවන්හි විවරණයට අනුව අවබෝධ නොකළ චතුරාර්ය සත්‍යය ඇත්තා අනභිසම්බුද්ධ යනුවෙන් හඳුන්වයි. 'බෝධිසත්ව' යනු අවබෝධ කරන්නා වූ පුද්ගලයා ය. බුද්ධයාන, බෝධිසත්වයාන, ඒකයාන යන පර්යාය නම්වලින් හැඳින්වෙන මහායාන බුදුදහම බුද්ධ පද ප්‍රාප්තිය නිෂ්ඨාකොට පවතී. බුද්ධත්වය සාක්ෂාත් කිරීම සඳහා මෙම දශ භූමි මඟින් ඉදිරිපත් කරන ප්‍රතිපදාව පර්යේෂණ ගැටලුව යි. එම බුද්ධත්වයට පත්විය හැකි එක ම මාර්ගය බෝධිසත්ව චර්යාව වන හේතුවෙනි. බෝධිසත්ව චර්යාවේ නෛසර්ගික අංගයක් අතුරෙන් භූමි හා පාරමිතා යන අංගද්වය ඉතා වැදගත් ය. බෝධි චිත්තය උපදවාගෙන බෝධිසත්වයකු බවට පත් වි අරිය පර්යේෂණයේ යෙදෙන අයෙකුට අනුක්‍රමයෙන් නිෂ්ඨාව වෙත ළඟා වීමට භූමියෙන් භූමියට ඉහළ නැගීමට හැකි වන්නේ පාරමිතා පරිපූර්ණයෙන් ය.

1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම. Kovidabuththala6@gmail.com

''භූමි" යන පදය පාලි හා සංස්කෘත භාෂා දෙකෙන් ම යෙදී ඇත. සාමාන්‍ය ව්‍යවහාරයට අනුව අරුත් දෙන පොළොව, භූමිය යන වචන හැරුණු විට ස්තරය, තත්වය, තලය වැනි අරුත් ද ප්‍රකාශ කෙරෙන බව මූලාශ්‍රයාගත තොරතුරු මඟින් දක්වයි. ආචාර්ය තෝෂීඉචි එන්දෝ පෙන්වා දෙනුයේ පාලි සම්ප්‍රදායෙහි මෙම පදය බෝධිසත්ව සංකල්පය හා සම්බන්ධ ව යෙදී ඇත්තේ අටුවා ග්‍රන්ථවල බව යි. භූමි යන පදය බෝධිසත්ව චර්යාවේ තල හෝ ස්ථර හැඳින්වීම සඳහා යෙදෙන මූලාශ්‍ර අතුරෙන් මහා වස්තුව ඉතා ඉපැරණි කෘතියක් වේ. මහා සාංඝික සම්ප්‍රදායට අයත් කෘතියක් සේ සැලකෙන මෙය මහායානය බිහිවීමට පෙර සම්පාදනය වූවකි. සර්වාස්තිවාදී සම්ප්‍රදායට අයත් කෘතියක් වන අභිධර්ම කෝෂයෙහි දී මෙම සංකල්පය ගැන සඳහන් වේ. එමෙන් ම මහායාන කෘති වශයෙන් ගැනෙන ප්‍රඥා පාරමිතා සාහිත්‍යයේ ද එම සංකල්පය විස්තර කෙරේ. 'භූමි' පදය මෙලෙස පාරිභාෂිත පදයක් වශයෙන් මහායාන කෘතිවල යෙදුණු අවස්ථාව බොහොමයක් තිබේ. සමහර තැනක භූමි යන පදයට පර්යාය වශයෙන් විහාර යන පදය ද යෙදෙයි.

බෝධිසත්ව චර්යාව විස්තර කිරීම සඳහා ම සම්පාදනය වූ බෝධි චර්යාවතාරයෙහි භූමි සංකල්පය පිළිබඳ සඳහන් නොවේ. එහෙත් එම කාලයට අයත් යැයි සැලකිය හැකි මධ්‍යවතාර බඳු කෘතීන්හි භූමි සංකල්පය පිළිබඳ සවිස්තර ව ඉදිරිපත් වෙයි. මහා වස්තුවෙහි දැක්වෙන දස භූමිවලට වඩා වෙනස් වූ දස භූමියන් දශභූමි සූත්‍රයෙහි සහ අවතංසක සූත්‍රයෙහි දැක්වේ. මෙහි දැක්වෙන මෙම ග්‍රන්ථ දෙකට ම වඩා වෙනස් වූ විග්‍රහයක් බෝධිසත්ව භූමි නම් ග්‍රන්ථයේ සඳහන් වේ. එහි දසභූමිය වෙනුවට දක්වා ඇත්තේ සප්ත භූමියකි. මහ වස්තුවේ භූමි දහයක් සඳහන් වේ. ඒවානම්, දුරාරෝහා, බුද්ධමාතා, පුෂ්පමණ්ඩිතා, රුචිරා, චිත්ත, රූපවති, දුර්ජයා, ජන්මනිර්දේශ, යෞව රාජ, අභිෂේක යනු යි. භූමි දහයක් නම් කෙරුණ ද මේ නම් හා දශභූමික සූත්‍රයේ සඳහන් භූමි දහයේ නම් අතර සමාන බවක් නැත. එපමණක් ද නොව මහා වස්තුවෙහි භූමි දහයක් නම් කොට විස්තර කෙරුණ ද එම විස්තර ක්‍රමවත් නැත. බෝධිසත්ව භූමි නම් කෘතිය දස භූමික සූත්‍රයට පසුව ලියවුණකි. එහි කර්තෘ මෙම භූමි විහාර දශභූමික සූත්‍රයෙහි දක්වනු ලැබූ භූමිවලට සමානාන්තර යැ යි හුවා දැක්වීමට ගෙන ඇති උත්සාහය සාර්ථක නැත. මෙම භූමි සංකල්පය සකසා ඇත්තේ සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂාව පාදක කොටගෙන බව පෙනේ. දස භූමික සූත්‍රයේ සම්පාදනය වීමෙන් අනතුරුව ඊට වඩා ක්‍රමවත් වීමෙන් ඊට වෙනස් වූ වර්ගීකරණයක් පාදක කොටගෙන භූමියේ සංකල්පය සකසා විස්තර කිරීමට බෝධිසත්ව භූමි සම්පාදකයා උත්සාහ ගෙන ඇති මුත් එය සාර්ථක ක්‍රමවත් උත්සාහයක් වශයෙන් හැඳින්විය නොහැකි බව විද්වතුන්ගේ මතය වේ (එන්දෝ, 1997: පි. 264).

දස භූමික සූත්‍රය තුළ ඉදිරිපත් කෙරුණු බෝධිසත්ව සංකල්පය අන් ඒවාට වඩා සාර්ථක උත්සාහයක් වේ. බෝධිසත්ව සංකල්පය ක්‍රමවත් ලෙස ඉදිරිපත් කිරීමට සමත්ව තිබේ. බෝධිසත්ව චර්යාව සමන්විත වන භූමි සංඛ්‍යාව දහයක් ය යනු ලෙස නිශ්චිත ලෙස තීන්දු කරනු ලැබුවේ ද, එය සිද්ධාන්තයක් ලෙස පිළිගනු ලැබුණේ ද දස භූමික සූත්‍රය මඟින් ඉදිරිපත් කෙරුණු විස්තරය හේතු කොටගෙන බව විද්වත්හු පෙන්වා දෙති (දයාල්, 1997: පි. 283). බෝධිසත්වයෙකු අනුක්‍රමයෙන් භූමියෙන් භූමියට පත්වෙමින් සීලගුණ දියුණු කර ගනිමින් ක්‍රමික ව නිර්මලත්වයට පත්වන රත්තරන් මෙන් පාරිශුද්ධියට පත්වන ආකාරය මේ කෘතිය මඟින් විස්තර කෙරේ. මෙම කෘතියට

අනුව දසභූමිය මෙසේ ය. ප්‍රමුදිතා, විමලා, ප්‍රභාකාරි, අර්චිස්මති, සදුර්ජයා, අභිමුඛී, දූරංගමා, අචලා, සාධුමතී, ධර්මමේඝා යනු යි. භූමි සංකල්පය ක්‍රමවත් කොට සකස් කිරීමේ දී පාරමිතා සංකල්පය බෙහෙවින් ඉවහල් කොටගෙන ඇති බව දසභූමික සූත්‍රයේ අධ්‍යයනයේ දී අවධාරණය වේ. මෙම සූත්‍රය මඟින් ඉදිරිපත් කරන ක්‍රමයෙන් ඉහළට යන භූමි පිළිබඳ සැකැස්මේ එක් එක් භූමියන් සඳහා වෙන් වුණු එක් එක් පාරමිතාව දැක්වේ. ප්‍රථම භූමිය වන ප්‍රමුදිතා භූමියේ දී දාන පාරමිතාව පූර්ණය කිරීමෙන් අරඹන මේ පාරමිතා පූර්ණය ක්‍රමයෙන් දෙවන භූමියේ දී ශීල පාරමිතාවත් තුන්වන භූමියේ දී ක්ෂාන්ති පාරමිතාවත් ආදී වශයෙන් පරිපූර්ණයට පත්කොට ධර්මමේඝා නම් දසවන භූමියේ දී ඥාන පාරමිතාව පරිපූර්ණත්වයට පත් කිරීමෙන් අවසන් කෙරේ (ධම්මජෝති හිමි, 1990: පි. 43).

බෝධිසත්ව සංකල්පය හුදෙක් එක් ගුරු කුලයකට සීමා වී දියුණු වූවක් නොවේ. ථෙරවාද මහායාන යන දෙපාර්ශ්වයේ ම මෙම සංකල්පය සමානාන්තරව දියුණු වුණු අතර ඒ පිළිබඳ විවිධ මතිමතාන්තර අන්‍යෝන්‍ය වශයෙන් බලපාන්නට ද ඇත. භූමි සංකල්පය ඈත අතීතයට ම යන්නක් වුව ද එහි සංඛ්‍යාව පිළිබඳ නිශ්චිත නිගමනයක් නොවූ බව අදාළ මහායාන කෘතිවලින් පැහැදිලි වේ. පසු කාලයේ දී ලංකාවතර සූත්‍රය දක්වනුයේ භූමි හතක් පිළිබඳව පමණි. මේ අතර ඊට පසු සමයක සම්පාදිත යැයි සැලකෙන බෝධිසත්ව භූමි සූත්‍රයේ භූමි හතක් හා විහාර දහතුනක් ගැන කරුණු දක්වයි. භූමි යන්නට විහාර යන පදය පර්යාය යැයි මහායාන සූත්‍රාලංකාරය සඳහන් කර ඇත.

දස පාරමිතා සංකල්පය බෝධිසත්ව සංකල්පය හා ක්‍රමානුකූල ව ගොනු කිරීමෙන් දස භූමික සූත්‍ර සම්පාදකවරයා අපේක්ෂා කොට ඇත්තේ දසභූමි සංකල්පයට පදනමක් සැපයීම ය. මහායානයේ විස්තර කෙරෙන පරිදි පාරමිතාවන් බෝධිසත්වයෙකුගේ සරණ නම් එය බෝධිසත්වයකුගේ දෙගුරුන් හා සමාන නම් සියලු පාරමිතා පරිපූර්ණත්වයට පත් කිරීම බෝධිසත්වවරයෙකු විසින් අනිවාර්යයෙන් ම කළ යුතු යන්න පිළිබඳ විවාදයක් පැවතිය නොහැකි ය. එම පාරමිතා දහය පරිපූර්ණත්වයට පත් කිරීමට නම් දස භූමි දහයක් තිබීම අත්‍යවශ්‍ය වේ. මෙවැනි කාරණාවලින් පැහැදිලි වනුයේ භූමි සංකල්පය අනුක්‍රමයෙන් වර්ධනය වූවක් බව ය. මෙසේ අනුක්‍රමයෙන් වර්ධනය කරනු ලැබුණේ බෝධිසත්ව චර්යාව ශ්‍රාවක නැතහොත් අරහත් චර්යාවට වඩා ශ්‍රේෂ්ඨය යන විශ්වාසය සනාථ කිරීමේ අරමුණෙනි.

බෝධිසත්ව පළමු වන භූමියේ දී හා ශ්‍රාවකයකු සෝතාපත්ති මාර්ගයෙහි දී ප්‍රගුණ කරන සමහර මූලික අධිශීල ගුණාංගයන් අතර සමාන කමක් දක්නට ඇතත් බෝධිසත්වයකු විසින් දියුණු කරනු ලබන නොයෙක් සමාධීන් පිළිබඳ ශ්‍රාවක චර්යාවේ සඳහන් වන්නේ නැත. බෝධිසත්ව භූමි සූත්‍රයෙහි දී අධිප්‍රඥා විහාර තුනක් සඳහන් කිරීමෙන් මෙම අවස්ථාවේ දී ප්‍රඥාව ප්‍රගුණ කිරීමට හිමිවන තැන කෙතරම් වැදගත් ද යන්නන පැහැදිලි වේ. බෝධිසත්ව භූමි සූත්‍රයෙහි භූමි හයක් පමණක් ගැන කෙරෙන සඳහනක් ද ඇත. මෙයින් ගම්‍ය වන්නේ එක් අවධියක දී නම් වශයෙන් සඳහන් කෙරෙන්නේ භූමි හයක් පමණක් ම ද යන්න නිශ්චිත වශයෙන් කිව නොහැකි ය. ශ්‍රාවක චර්යාවේ සෝතාපන්න, සකදාගාමී, අනාගාමී වශයෙන් ශ්‍රාවකයෙකු විමුක්ති මාර්ගය ඔස්සේ දියුණුවන ආකාරයට සමාන විස්තරයක් දස භූමික සූත්‍රයේ දී දැක්වේ. දෙවන භූමිය වන විමලා භූමිය තුළ සෝතාපන්න. සකදාගාමී යන අවස්ථා දෙකේ ම

ලක්ෂණ අඩංගු වේ. මෙහි දී විශේෂ වශයෙන් සීලයේ ප්‍රගුණ කිරීම කෙරෙහි යොමු වී ඇත. අනාගාමී තත්ත්වයට පත්වන ශ්‍රාවකයාගේ වැඩි අවධානය අධිචිත්තය ප්‍රගුණ කිරීම ප්‍රභාකාරී නැතහොත් තුන්වන භූමියේ දී සිදු වේ. විශේෂයෙන් ම සමාධිය කෙරෙහි නැඹුරු වන ආකාරය දක්ව යි. හතරවන පස්වන හා සයවන භූමිවල දී එනම් අර්චිස්මතී සුදුර්ජයා සහ අභිමුඛී යන භූමිවල දී බෝධිසත්වයත් සුවිශේෂ වශයෙන් යොමු වන්නේ අධි ප්‍රඥාව දියුණු කිරීමට ය. භූමි සංඛ්‍යාව දහයක් යන මතය තහවුරු කිරීම සඳහා සම්පාදිත දස භූමික සූත්‍රය වුව ද මෙම භූමි හත පිළිබඳ සංකල්පය දැන සිටි බව එම සූත්‍රයේ ම කෙරෙන සඳහන් මඟින් ප්‍රකට වේ. හත්වන භූමියට පත්වන බෝධිසත්වයා එහි දී සියලුම පාරමිතාවන් පරිපූර්ණත්වයට ගෙන එන බවත් එම බෝධිසත්වයාට රිසි වන්නේ එම භූමිය  අවසානයේ නිර්වාණය සාක්ෂාත් කළ හැකි බවත් දස භූමික සූත්‍රය දක්ව යි.

මේ උත්සාහය කිසියම් දුරකට හෝ සාර්ථක වී ඇත්තේ උපාය නැතහොත් උපාය කෞශල්‍ය පාරමිතාව මෙම සැලැස්මට එකතු කිරීම හේතු කොට ගෙන ය. ඇත්ත වශයෙන් ම බෝධිසත්වයකු ශ්‍රාවක නිෂ්ඨාව පසු කර බොහෝ ඉදිරියට යන යා යුතු අයකු බව හුවා දැක්වීමට උපකාරී වී ඇත්තේ මෙම පාරමිතාව ය. බෝධිසත්වයා පුද්ගල විමුක්තිය පරදුවට තබා අන් අය විමුක්තිය කරා යොමු කිරීමට ගෙන යැමට කැපවුණු පරාර්ථකාමී උත්තමයෙක් ය යන්න අවධාරණය කිරීමට මෙම පාරමිතාව බෙහෙවින් වහල් වී ඇත. මහායානයෙහි ඉදිරිපත් කෙරෙන බෝධිසත්ව සංකල්පයේ සුවිශේෂ ලක්ෂණය ද මෙය ය. ශ්‍රාවක නැතහොත් අර්හත් නිෂ්ඨාව පුද්ගල විමුක්තිය කේන්ද්‍රිය කොට පවතින්නේ යැයි එල්ල කෙරුණු චෝදනාව වඩාත් සාධාරණීකරණය කිරීමට මහා කරුණා ගුණය ප්‍රායෝගිකව උපයෝගී කොටගෙන සියලු සත්ව විමුක්තිය ඇති කිරීමට බෝධිසත්වයකු සමත් වන බව පෙන්වීමට මේ උපාය කෞශල්‍ය පාරමිතාව පරිපූර්ණත්වයට පත් කිරීම අතිශයින් ම වැදගත් වන බව දශභූමික සූත්‍රය මඟින් තහවුරු කරනු ලැබ ඇත.

**නිගමනය**

මෙම විමර්ශනය අධ්‍යයනය තුළ දී මහායාන බෝධිසත්ව භූමි සංකල්ප තුළ ඇති විශේෂ කරුණු අනාවරණය වේ. බෝධිසත්වයෙකු බෝධි සම්භාරය පූරණය කිරීමට අවශ්‍ය වන භූමි පිළිබඳ මෙහි දී අවධාරණය වේ. මෙහි බෝධිසත්ව සංකල්පය තුළ බිහිවූ කෘති හා ගුරුකුල පිළිබඳ අවබෝධ කරගැනීමට අවකාශය ඇත.

**ප්‍රමුඛ පද** - ථෙරවාද, බෝධිසත්ව, භූමි, මහායාන, සම්ප්‍රදාය

**ආශ්‍රිත ග්‍රන්ථ**


එන්දො, ටී. (1997). *ථෙරවාද බුදුන් වහන්සේ.* නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ධම්මජොති හිමි, එම්. (1990). *මහායාන මූලික සංකල්ප.* කොළඹඃ ගොඩගේ පොත් ප්‍රකාශකයෝ.

සාසනරතන හිමි, එම්. (1996). *බෝධි චර්යාවතාරය.* කොළඹඃ අතුල මුද්‍රණාලය.

සාසනරතන හිමි, එම්. (1999). *ලක්දිව මහායාන අදහස්.* කොළඹඃ විසිදුණු ප්‍රකාශකයෝ.